# බුදුන් වදාළ විද්‍යාත්මක ධර්මතාවය

**අතිපූජනීය**

**මහනුවර වජිරබුද්ධි මහ රහතන්වහන්සේ**

**2018 ඔක්තෝම්බර් 28**



## අතිපූජනීය
## මහනුවර වජිරබුද්ධි මහ රහතන්වහන්සේ

## කරුණාවෙන් සළකන්න:

**මෙම පහත සටහන් කර ඇති සද්ධර්ම ලිපිය 2018 වසරේ ඔක්තෝම්බර් මස 28 වන දින අතිපූජනීය මහනුවර වජිරබුද්ධි මහ රහතන්වහන්සේ විසින් සිදුකළ සද්ධර්ම සාකච්ඡාවකි. එය උන්වහන්සේගේ අවසරය මත, විඩියෝපටයක් ලෙස එදින පටිගත කරනු ලැබූ අතර එම දේශනාව මහ තෙරුණ්‍ණුවන් කථාකරන භාෂාවෙන්ම, එලෙසින්ම මෙහි ඇතුළත් කර ඇත්තේ එම දේශනාවෙහි ඇති ජීව ගුණයට සහ හරවත් බවට කිසිදු හානියක් සිදු නොවනු පිණිසයි.**

"මේ දවස්වල ගොඩාක් අපිට, මේ බුදු දහම පිළිබඳ වාද විවාද දකින්ට ලැබෙනවා. ප්‍රශ්න ගොඩාක් එක එක්කේනා කථා කරනවා පේනවා. හරි බුද්ධාගම මොකද්ද?...., වැරදි එක මොකද්ද?...., කවුද විකෘති කරන්නේ?...., කවුද හරි එක කියන්නේ?,... එකිනෙකා බෙදිලා එක එක්කෙනා විවේචනය කරගන්න, බොහොම හැලහැප්පිලි බහුල කාලයක තමයි මේ අපි දැන් ඉන්නේ. ඉතින් ගොඩාක් අයට මේ ගැටළු ඔක්කොම ඇතිවෙලා තියෙන්නේ, හරියට මේ... මම හිතන්නේ බුදු දහම, බුදුන් වදාළ දහම අධ්‍යයනය කරේවත්, එහෙම නැත්නම් ප්‍රගුණ කරලා ඒ අවබෝධයවත් ලබලා, ලබාගන්ට උත්සාහ නොකර , එක එක තැන්වලින්, පොත් වලින්, අටුවා වලින්, වෙනත් වෙනත් තැන් වලින් ගත්ත තොරතුරු අරගෙන , තමන් කැපී පෙනෙන්ට හෝ ප්‍රසිද්ධිය සඳහා හෝ , නැත්නම් තමා වටා පිරිසක් රැස්කරගන්ට හරි, මොනව හරි හේතු නිසා මේ කරගෙන යන වැඩසටහනක් නිසා තමයි කියලා හිතෙනවා මටනම් මේ වගේ දේවල් වෙන බව පේන්ට තියෙ න්නේ. ඉතින්, මම මේක කිව්වේ මේ අපි ඒ වාදෙට පැටළෙන්ට නෙමෙයි, අපි මේකට උත්තර හොයාගන්ට ඕනේ.

ඉතින්, මේකට හොයන්ටනම් උත්තර, බුදුන් වහන්සේගේ දේශනාව තුළින්ම ගන්ට ඕනේ මේ හරි බුදු දහම මොකද්ද කියලා, බුද්ධ දේශනාව මොකද්ද කියලා තේරුම් ගන්ට උත්සාහ කරන්නට ඕනේ. ඒ කරලා, ඒ ප්‍රතිපදාව පුරලා, ඒ බුදුන් වහන්සේ අපේක්ෂා කරපු, අපිට උගන්නපු, ඒ උත්තරීතර, ඒ විමුක්තියට පත් වෙන්ට කටයුතු කරන එක තමයි කල යුත්තේ. ඉතින්, ඒක එසේ නොකර ගුරු අසුරින් ඒ අත්දැකීම් සහිත අයගෙන් මේක අරගෙන , තමන් අත් විදලා ඉවර වෙලා මේ දේශනා කරනවා වෙනුවට, මට පේන්නේ ගොඩක් අය පොත දිහා බලාගෙන, වචන අල්ලගෙන, මේ දේශනා කරන්ට ගිහින් තියෙනවා. ඒකෙන් තමයි මේ ගැටළු ගොඩාක් මතුවෙලා තියෙන්නේ කියලා තමයි පේන්ට තියෙන්නේ. හරියට නිකන් අර මම කවදත් කියනව වගේ ජාති අන්ධයෝ අලිය බලන්ට ගිහිල්ලා, එක එක අලියගේ අවයව අල්ලගෙන, අලියා මෙහෙමයි කියලා ප්‍රකාෂ කරා වගේ වැඩක් කරන බව තමයි පේන්නේ. අනික තව එකක්, ගොඩක් අය මේ කතා කරනවා නිවන ගැන, ලෝකෝත්තර තත්ත්වය ගැන. මේක ලේසි එකක් නෙවෙයි. නිවන විස්තර කරනවා කියන එක කරන්ට පුලුවන් නිවන දැකපු කෙනෙකුටනේ. ඉතින් ඒකත් විස්තර කරන්ට වෙන්නේ මේ ලෝකෝත්තර තත්ත්වයක් ගැන විස්තර කරන්ට වෙන්නේ මේ ලෞකික වචන වලින් . ලෝකෝත්තරය දැකපු නැති , ලෞකික මිනිස්සුන්ට. උදාහරණයක් හැටියට ගත්තොත් හරියට අර පොකුණේ ඉන්න මාළුවාට ඉබ්බා ගොඩබිම ගැන කියන්ට

ගියහම ඇතිවුන ප්‍රශ්නේ තමයි. ඔයගොල්ලෝ ඒක අහලා ඇතිනේ. මළුවෝ ටික ඉන්නවා පොකුණේ. ඉබ්බෙකුත් හිටියා. ඉබ්බා ටික දවසක් පේන්න හිටියේ නෑ. මාළුවෙක් අහනවා මොකද යාළුවේ මේ දවස් වල පේන්ට හිටියේ නැත්තේ, කොහේද ගියේ කියලා. ඉතින් ඉබ්බා කියනවා මම ගොඩබිමට ගියා. ඉතින් මාළුවා කවදාවත් ගොඩබිම දැකලා නෑ. ඉතින් දැන් මාළුවට හරි ආසයි දැන් මේක දැනගන්ට. ඉතින් ප්‍රශ්න කරනවා . ඉතින් අරයා අහනවා, ගොඩබිමත් වතුර තියෙනවද? ගොඩබිම පීනන්ට පුළුවන්ද? ඔයවගේ ඉතින් මාළුව දන්න අත්දැකීම් හරහා තමයි ප්‍රශ්න කරන්නේ. හැබැයි ඉතින් ඉබ්බා කියනවා නෑ වතුර නෑ, පීනන්ට බෑ, ඇවිදගෙන යන්ට ඕනේ. හැබැයි ඉතින් මේවා කවුරුත් දනේ නෑනේ මේ මාළුවෝ. ඉතින් ඒ හා සමාන දෙයක් තමයි මේ වෙන්නේ. බුදුන් වහන්සේ මේ දහම හොයාගෙන, මාර්ගය වඩලා, ඒ නිවන් දැක්කට පස්සේ නිවන මොකද්ද කියලා කොච්චර කිව්වත් තේරෙණ්නේ නෑ, අර මාළුවට ගොඩබිම ගැන කියනවා වගේ තමයි. ඉතින් අද ඒක එහෙම තියෙද්දි පොතේ නැත්නම් ඒ දේශනා ටික පොත් වල ලියලා තියෙනවා එකතු කරලා, ඒක කියවල ඉවරවෙලා, දැන් දහම් දෙසනවා. ඒකත් හරියට අර ජාති අන්ධයෙක් අනිත් අයට වර්ණ ගැන කතා කරනවා වගේ තමයි. නැත්නම් ආලෝකය ගැන කතා කරනවා වගේ තමයි. මම මේ උදාහරණ ටික කිව්වේ ඔයගොල්ලන්ට ලේසී මේක තෙරුම් ගන්ට එතකොට. ඒ හා සමාන සංකීර්ණ , ගැඹුරු, පුළුල් දෙයක් මේ බුදුන්වහන්සේ දේශනා කළේ. ඒකයි මේක ලෝකෝත්තර කියලා කියන්නේ, ඇස කණ දිව නාසය ශරීරය කියන මේ ඉන්ද්‍රිය වලට ගෝචර වෙන්නේ නෑ, නැති, එතනින් එහා ගිය , මේ ඉන්ද්‍රිය ගෝචර තත්ත්වයෙන් එලියට ගිය තත්ත්වයක් ගැනයි බුදුන්වහන්සේ දේශනා කරන්නේ. හැබැයි ඉතින් අපි ඒ අර රාමුව තුල ඉදගෙන, ඉන්ද්‍රිය ගෝචර ලෝකය තුල ඉදගෙන මේක කතා කරන්ට ගියහම තමයි මේ ප්‍රශ්න ඇතිවෙන්නේ , කල්ලි ගැහෙන්නේ, වාද කරන්නේ, අරයා විකෘති කරනවා, මෙයා විකෘති කරනවා, මම තමයි හරි, අරයා වැරදී කිය කිය මේ මේ වාද විවාද ඇතිවෙන්ට හේතු වෙලා තියෙන්නේ මේකයි.

ඉතින්, අපි බලමු මෙකෙන් ගොඩ එන්ට මොනවද අපිටත් කරන්ට පුවන් දෙයක් අපි කල්පනා කරොත් මේ ඇත්තටම නිර්මල බුදු දහම හොයාගෙන යන්ට පුළුවන්. අපිට ඒකෙන් ගන්නනම් මෙකෙ උත්තරේ ඉවරයි .දැන් අපි දන්නවා පැහැදිළිවම බුදුන් වහන්සේ බුද්ධත්වයට පත්වෙලා ඇවිල්ල පළවෙනි දේශනය ධම්මචක්කප්පවත්ථන සූත්‍රය. පස්වග තවුසන්ට කියපු එක. ඉතින්, අපි එතෙන්ට ගියානම් මේ ඔක්කොම ගැටළු ටික, ඒක තුළ තියෙනවා උත්තර ටික. මොකද බුද්ධ දේශනාවම අවුරුදු හතළිස් පහම

කළේ ධම්මචක්කප්පවත්ථන සූත්‍රය  කියපු ටික තමයි, එතනින් එහා මුකුත් නෑ. බුදුන් වහන්සේ අවබෝධ කරගත්තේ ඒ පළවෙනි දේ, ඒ තවුසෝ පස් දෙනාට  අවිල්ලා කිව්වා. දැන් ඇවිල්ලා එතනදී කියනවා බුදුහාමුදුරුවො... දැන් තවුසො කියන්නේ, පස්වග තවුසො කියන්නේත් මේ සසර බිය දැකලා එයින් ගැළවෙන්ට වීර්ය වඩන පිරිසක්නේ. දැන් ඒ තවත් අය හිටියා. පස්වග තවුසන්ව තමයි මෙයා තෝරගත්තේ. මොකද අලාර කාළාමලා ඒ කාලේ හිටියේ නෑ. බුදුහාමුදුරුවො දන්න අය හින්දා මේගොල්ලෝ ගාවට ඇවිල්ලා එයා පළවෙනියටම කිව්ව "මහණෙනි මේ විමුක්තිය සඳහා යන පිරිස කළයුතු ප්‍රධාන කාර්යයක් තියෙනවා ." මුළින්ම කලයුත්තක්, මොකද්ද?.... අත් හළයුතු අන්ත දෙකක් තියෙනවා කිව්වා. දැන් සමහරු මේ සූත්‍රය අල්ලගෙන කියනවා අර අන්තෙත් අතහරින්ට, මේ අන්තෙත් අතහරින්ට, මැදට එනට. පස්සේ මැදත් අතහරින්ට කියලා. හැබැයි ඉතින්, අර අන්තේ මොකද්ද?  මේ අන්තේ මොකද්ද ? මැද මොකද්ද කියන්නේ නෑ. එහෙම කිව්වේ නෑ  බුදුහා මුදුරුවො .  බුදුහාමුදුරුවො  කිව්වා  අත්හළයුතු අන්ත දෙකක් තියෙනවා. මොකද්ද එක අන්තයක්?. එක අන්තයක් කාමසුඛල්ලිකානු යෝගය කියලා කිව්වා. ඊලගට ඒකට ප්‍රතිවිරුද්ධ අනිත් අන්තේ මොකද්ද? අත්ථකිලමතානු යෝගය කියළා කිව්වා.

දැන්, කාමසුඛල්ලිකානු යෝගය කියලා කියන්නේ කම් සැප විදීම. ඉන්ද්‍රියන් පිනවන එකට. ඉතින් ඒක බුදුහාමුදුරුවෝ, සිද්ධාර්ථ කුමාරයා රජ මැදුරේ ඉදගෙන, මාලිගා තුනක ඉන්න ගමන්, යශෝධරාව හිටියා, අන්තප්පුර තිබුණා රට වැසියා හිටියා, මේ බොහොම රජ සැප වින්දා. ලැබිච්ච විමුක්තියක් නෑ. ඒ නිසා තමයි ඒක අතහැරළා ගියේ විමුක්තිය හොයාගෙන. දැන් ඒ කාලේ අනෙකුත් අයත් විමුක්තිය හොයාගෙන ගිය ක්‍රමයක් තිබුණා. ගිහිල්ලා ඒ ගොල්ලෝ කරේ , මේ පව් ගෙවලා ඉවර කරන්ට ඕනේ එහෙම නැත්නම් මේ පව අවසානයේ තමයි අපි විමුක්තියට යන්නේ , නැත්නම් ස්වර්ගයට යන්නේ , නැත්නම් මහා බ්‍රහ්මයා ළගට යන්නේ, මොකක් හරි ඒ ශුද්ධාත්මයකට යන්නේ කියන අදහස් දරමින් පව් ගෙවලා ඉවර කරන්ට ඕනේ කියලා හිතාගෙන ශරීරයට දුක් දුන්නා. ඒ ශරීරයට දුක් දීමත් එක්තරා යෝගයක්, ඒ කියන්නේ මේ විමුක්තිය ලබන ක්‍රමයක් හැටියට සලකළා තමයි ඒක කරේ මිනිස්සු. බුදුන් වහන්සේත් ඒක කරා ගිහිල්ලා. රජ සැප විදලා ලැබිච්ච දෙයක් නෑ , අතහැරළා ගිහිල්ලා අර උද්දකාරාම, අලාර කාළාමලා ගාවට ගියා . ඊට පස්සේ ඒවත් අතහැරළා ගිහිල්ලා එතනත් ධර්මය නෑ කියලා , එයා උත්සාහ කරල බලුවා අනිත් අය කරනවා වගේ ශරීරයට දුක් දීලා. දැන් ඒ දුක දුන්න හැටි තියෙනවා ඔයගොල්ලන්ට බලන්ට පුළුවන් , මහා සීහනාද සූත්‍රයේ. අරන් කියවන්ට.

මම දැන් කතා කරන්ට යන්නේ නෑ. මොකද?…ඒ සූත්‍රය කිව්වොත් තේරෙයි කොයිතරම් බුදුහාමුදුරුවො මේ ශරීරයට දුක් දීමක් කරාද කියලා. බුදුහාමුදුරුවො ඒ සූත්‍රයේ සාරිපුත්ථට කියනවා, "සාරිපුත්ථ මම කොයිතරම් අත්ථකිලමතානු යෝගය ප්‍රගුණ කරාද කියනවාතම්, මට වැඩිය ශරීරයට දුක් දුන්න කෙනෙක් නෑ. ඉන්නවාතම් මට සමාන හෝ ඊට පහල කෙනෙක් විතරයි" කියලා . මෙහෙම ලස්සනට බුදුහාමුදුරුවො කියනවා. හැබැයි එහෙම කරලත් එයාට විමුක්තියක් ලැබුනේ නෑ කියලා කියනවා. එතකොට ඒක තමයි බුදුහාමුදුරුවො මේ පස්වග තවුසන්ට ඇවිල්ලා කිව්වේ, "මහණෙනි මේ විමුක්තිය සඳහා යන කවුරු හරි ඉන්නවාතම් අත් හළයුතු අන්ත දෙකක් තියෙනවා. එකක් තමයි කාමසුඛල්ලිකානු යෝගය , අනික අත්ථකිලමතානු යෝගය" කියලා කිව්වා. එතකොට, දැන් අර අන්තය මේ අන්තය නෙවෙයි ඈ…. අන්ත දේක පැහැදිළිව කිව්වා. බුදුන්වහන්සේ හරියට උත්තරේ දීලා තියෙනවා. අපිට ඕනේ විදිහට අර්ත කථන දෙන්න බෑ. ඒ අන්තේ මේ අන්තේ කිව්වහම ඕනේ මිනිහෙකුට එක එක අර්ත කථන දෙන්න පුළුවන්. හරියට අපි ඉස්කෝලේ යන කාලේ සම්මාදිට්ඨිය කියන්නේ නිවැරදි දැකීම කිව්ව වගේ තමයි. නිවැරදි දැකීම මොකද්ද කියලා ඇහුවහම එක එක්කෙනා එක එක පුද්ගලික අදහස් කිව්වා. ඒ වගේ අන්ත දෙක ගැන කියන කොට මේක පැහැදිළිව කියන්ට ඕනේ. එකක් අත්ථකිලමතානු යෝගය, අනික කාමසුඛල්ලිකානු යෝගය. කාමසුඛල්ලිකානු යෝගය කියලා කිව්වේ ඉන්ද්‍රිය පිනවන එක, අත්ථකිලමතානු යෝගය කෙව්වේ විමුක්තිය සඳහා ශරීරයට දුක් දීම. හැබැයි මේ දුක් දීම කියන එක දැන් සමහරු විග්‍රහ කරනවා මේ ආරණ්‍ය ගතෝවා, වෘක්ෂමූල ගතෝවා කිව්වහම, මේ කැලේට යන එකත් එක අන්තයක්ලු. ඒක අත්ථකිලමතානු යෝගයලු. දැන් මේ විහිළු මේවා. හැම සූත්‍රයකම භාවනා ව පටන් ගන්නේ රණ්‍යගතෝවා, වෘක්ෂමූල ගතෝවා, ශූන්‍යාගාර ගතෝවා කියලා. ඇයි මේ රණ්‍යගතෝවා, වෘක්ෂමූල ගතෝවා, ශූන්‍යාගා ර ගතෝවා කියලා කියන්නේ. කාමසුඛල්ලිකානු යෝගයෙන් ඉවත් වුනා. කාමයන් අතහරින්නේ. කාමයන් අත හැරළා කාමයන් නැති තැනකට යනවා කියන එක අත්ථකිලමතානු යෝගය වෙන්නේ කොහොමද? එතකොට ඒ මනුස්සයා ගිහිල්ල ගිනි අව්වේ ගිනි ගොඩවල් ගහගෙන ඒක මැද ඉන්නවද? සීතලේ වෙව්ල වෙව්ල නිරුවතින් ඉන්නවද? එහෙම නැත්තම් අර බොහොම ලස්සනට කියනවා බුදුහාමුදුරුවෝ . මම ඒ ටික දැන් කියන්ට යන්නේ නෑ දුක් දෙන හැටි යෝගයක් හැටියට.

ඉතින්, එතකොට ඒක තෙවෙයි මේ කියන්නේ. මේ එක එක්කෙනාට ඕනේ ඕනේ විදිහට තමන්ගේ වාසියට මේ ධර්මය අර්ත කථන දෙන්න යනවා. භාවනාව ජීවිතේට කරපු නැති, නෙක්ඛම්මය අඳුරන්නේ වත් නැති, හුලගක්වත් වැදිලා නැති, උණුසුමක් නොදැනිච්ච මිනිස්සු, ආරණ්‍යගතෝවා කිව්වහම කියනවා මේක මේ අත්ථකිලමතානු යෝගයලු. එහෙම එකක් කිව්වේ නැතිලු. මේ අත්ථකිලමතානු යෝගය මොකද්ද කියලා බුදුහාමුදුරුවෝ බොහොම ලස්සනට විස්තර කරනවා, ධම්මචක්ක සූත්‍රයේ ඒ විස්තරේ නොතිබුණාට වෙනත් තැන් වලත් තියෙනවා දුක් දෙන හැටි, සැප විදපු හැටි බුධිරාජ කුමාරයාට කියනවා. "බෝධිරාජ මට ඒ කාලේ මාළිගා තුනක් තිබ්බා. මට අන්තඃපුරයක් තිබුනා" කියනව. " මේ තරම් ප්‍රමාණයක් මා වටකරගෙන සුරූපී කන්‍යාවෝ හිටියා" කියනවා. එතකොට " මාගේ මළිගාවල හිටිය දාසයන්ටත් අපි ආහා රයට දුන්නේ, මස් සහිත ඇල් හාලේ බත්" ඒ වගේ ලොකු කතන්දරයක් කියනවා. බොහොම ලස්සනට මේවා තියෙනවා. එතකොට මේ දෙකම නිවන් දකින්ට , නැත්තම් විමුක්තිය සදහා හාදයි. ඒකයි බුදුහාමුදුරුවො කිව්වේ අත් හරින්ට ඕනේ අන්න දෙක තමයි කාමසුඛල්ලිකානු යෝගයයි අත්ථකිලමතානු යෝගයයි . හැබැයි ඒක අපිට ඕනේ විදිහට අර්ත කථන දෙන්ට බෑ.

බුදුහාමුදුරුවෝ කාමසුඛල්ලිකානු යෝගයත් කිව්වා. අත්ථකිලමතානු යෝගයත් කියලා තියෙනවා. මම හිතන්නේ ඒ කියපු ටික තේරුණා ඔයගොල්ලන්ට, ඉතුරු ටික හොයලා බලන්ට. එතකොට මේ අන්ත දෙකයි අත්හළ යුත්තේ. හැබැයි ඒ දෙක අතහැරළා මොකද කරන්නේ. නිකන් හිටියහම හරියනවද? නෑ. බුදුහාමුදුරුවො කිව්ව නෑ ඒක අතහැරළා විතරක් බෑ, ඊලගට කරන්ට දෙයක් තියෙනවා. මම ඒක හදුන්වනවා මධ්‍යම ප්‍රතිපධාව කියලා. ඇයි, අර අන්ත දෙකට නොවැටෙන හින්දා. අත්ථකිලමතානු යෝගයත් නෙමෙයි, කාමසුඛල්ලිකානු යෝගයත් නෙමෙයි, ඒ දෙකටම නොවැටෙන හින්දා මම කියනවා මේකට මධ්‍ය ම ප්‍රතිපධා ව කියලා. මොකද්ද මධ්‍යම ප්‍රතිපධාව කියන්නේ ? අපිට ඕනේ ඕනේ එකද්ද? හිතෙන එකද්ද? නෑ. පැහැදිළිවම කිව්වා අංග අටකින් යුක්ත ආර්ය අෂ්ටාන්ගික මාර්ගය. සම්මාදිට්ඨිය, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා අජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි කියලා බොහොම පැහැදිළිව කියනවා. ඊට පස්සේ අර දෙකට නොවැටෙන හින්දා මම මධ්‍යම ප්‍රතිපධාව කියලා කියනවා කිව්වා. දැන් පැහැදිළීනේ එතකොට . ඔය එක එක්කෙනාගේ බත වලින් අපිට වැඩක් නෑ, අර අන්තය අතහරින්ට මේ අන්තය අතහරින්ට , ඊට පස්සේ මේකේ මැදට එන්න, පස්සේ මැදත් අතහරින්ට, මේ කොහෙන්දෝ අල්ල ගත්තා. මැද අතහරිනවා කියලා

කිව්වේ මොකද්ද? අන්තිමට බුදුහාමුදුරුවෝ කිව්වේ මොකද්ද මධ්‍යම ප්‍රතිපධාවත් එතෙර වීම සදහා පමණයි. කරේ තියගෙන යන්ට නෙමෙයි. අර හරියට ගඟකින් එතෙර වෙන්ට හදාගත්ත පහුරක් වගේ. ගඟෙන් එතෙර උනාට පස්සේ පහුර කරේ තියාගෙ න යන්නේ නෑනේ. පහුර අතඇරලා දාල එයා යන්ට යනවා.

ඒ වගේ විමු ක්තියට ගියාට පස්සේ නිවන දැ ක්කට පස්සේ අර්ය අෂ්ටාන්ගික මාර්ගයෙන් වැඩකුත් නෑ. එතකොට ඒකත් අතහරිනවා. මුළින් කාමසුඛල්ලිකානු යෝගය සහ අත්ථකිලමතානු යෝගය කියන අන්ත දෙක අතහරිනවා. මධ්‍යම ප්‍රතිපධාව වශයෙන් අර්ය අෂ්ටාන්ගික මාර්ගය වඩනවා එතෙර වෙන්ට. නිවන් දැක්කට පස්සේ ඒකත් වැඩක් නෑ. තව සමහරු මට ඇහිලා තියනවා කියනවා නෑ නෑ මේකත් පහුරකට සමාන කරේ ධර්මයෙ නුත් අල්ල ගන්ට එපාලු. දැන් ආර්ය අෂ්ටාන්ගික මාර්ගය වඩන්නේ නැතිව කොහොමද එතෙර වෙන්නේ. පහුරේ නැගලා එතෙරට යන්නේ නැතුව කොහොමද, පහුර මෙතන ඉදන් අතහැරියො ත් මෙතෙරමනේ අපි. මෙන්න මේ වගේ කතන්දරත් අපිට අහන්ට ලැබෙනවා. මම මේ කවුරුවත් විවේචනය කරන්ට හෙලා දකින්ට නෙමෙයි. මමත් මේ සමාජයේ පය ගහලා හිටපු මිනිහෙක් හැටියට, අදත් ඉන්න හැටියට, අපිට අහන්න දකින්න ලැබෙන , මගෙ ලගට අවිල්ලා කියන අය, වෙනත් මාර්ග වලින් මගෙන් අහන ප්‍රශ්න වලින් මේක තෙරෙන හිත්දයි මම මේ ටික කතාකරන්නේ. දැන් පැහැදිළිද ඔයගොල්ලන්ට එතකොට. බුදුහාමුදුරුවෝ මොකද්ද කිව්වේ අත් හළයුතු අන්ත දෙකක් තියෙනවා. එක පැත්තකින් කාමසුඛල්ලිකානු යෝගය. ඒ කියන්නේ ඉන්ද්‍රිය පිනවීම . අනිත් පැත්තෙන් අත්ථකිලමතානු යෝගය, ශරීරයට දුක් දීම. විමුක්තිකාමියෙ ක් වශයෙන් විමුක්තිය සොයාගෙන ගිහිල්ලා ඒක කරොත් ඒකත් වැරදී. එතකොට අත්ථකිලමතානු යෝගය සහ කාමසුඛල්ලිකානු යෝගය වශයෙන් අන්ත දෙක අතහරිනවා. ඊට පස්සේ අපි ඒ වෙනුවට බුදුන්වහන්සේ දේශනා කරනවා මාර්ගයක්, අංග අටකින් යුක්ත ආර්ය අෂ්ටාංගික මාර්ගය ඒක තමයි මධ්‍යම ප්‍රතිපධාව කිව්වේ. අපි ඒක පිළිපැදලා නිවන් දැක්කාට පස්සෙ ඒකත් අත හරින්නට දෙයක් නෑ අත හැරෙනවා මොකද එතැනින් එහාට තවදුරටත් ගෙනියන්නෙ නෑ. ඕක තමයි බුදුහාමුදුරුවො කියපු දෙක. ඔය තමයි ද්විත්වය, ද්වය. කතා කරනවා සමහරු මේ දෙකක් තියෙනවා කියලා ඔන්න දෙක. බුදුන්ව හන්සේ කියපු දෙක ඇ ද්විත්වය වෙන වෙන ඒවා නෙමෙයි.

ඊළඟට ඔය ද්විත්වයක්, නැත්තම් දෙකක් ගැන කතා කරපු තවත් තැනක් බුදුන්වහන්සේගෙ තියෙනවා. දැන් මේ මම යන්නේ අද ඇතිවෙලා තියෙන අවුල් ජාලය තුළ මේ හුගාක් අය මේ දහමට උනන්දුවක් දක්වන අයට ලොකු ගැටලුවක් මේක. එක එක්කෙනා එක එක කියනවා. පොත්වල ලොකු සූත්‍ර සංඛ්‍යාවක් තියෙනවා ඒවාට පස්සේ කාලෙක ඒවා නොතේරෙ නවා කියලා තව සමහරු ලිව්වා යම් යම් අටුවා කියලා, මම නම් ඒවා කෙටියෙන් හඳුන්වන්නේ ‘Footnote’ කියලා එහෙමත් නැත්තම් පා සටහන් හැටියට. අරක නොතේරෙන කොට යටින් ගැහුව පා සටහන් ඒක ඒවා පොත් ගොඩක් එකතු වෙලා අටුවා බවට පත් වුණා. මම දන්නෑ මේක සරලව තේරෙන්ට මම මේ කිව්වේ. ඉතින් මේ දැන් අරක තේරෙන්නේ නෑ ඊට පස්සේ අටුවාව කියවනවා, අටුවාව තේරෙන්නේ නැති වුණාම තව මොකක් හරි එකක් ලිව්වා. ඔහොම ඔහොම ටීකා, ටිප්පනි, එහෙම තේද ? සන්න, ගැටපද එහෙම කියලා පොත් මාලාවක් ලියවුණ. පුස්තකාල පිරෙන්න පොත් ලියවුණා, චතුඪ්‍ය සත්‍ය වල් වැදුණා, දැන් වෙලා තියෙන්නේ මිනිස්සුන්ට මොකක්ද ඇත්ත මොකක්ද හරි ඒ, වගේම දේශකයො පහල වුනා ධර්මය දැකල නෑ ධර්මයේ සුළඟක් වත් වැදිලා නෑ. ගුරුවරයකු ඇසුරු කරලා නෑ, බුදුන්වහන්සේගෙ මාර්ගයේ යන්න තියා යන්න හිතල වත් නැතුව. පොත්වල අකුරු දිහා බලාගෙන අර මාළුවෝ ටික ගොඩබිම ගැන ඉබ්බාගෙ න් අහගත්තා වගේ අහගෙන ඉන්න මාළුවන්ට ගොඩබිම ගැන කියන්ට යනවා වගේ වැඩක් තමයි මේ වෙන්නේ. එහෙම නැත්තම් අර ජාති අන්ධයෝ ඉපදෙනකොටම අන්ධ වෙලා හිටියා, මෙහෙම අලෝකය කියලා එකක් තියෙනවා, මෙන්න මෙහෙම වර්ණ කියලා ජාතියක් තියෙනවා කියලා අහලා තිබුන දේ අල්ලගෙ න , තවත් අන්ධයොන්ට වර්ණ ගැන කියනවා වගේ වැඩක් තමයි වෙන්නේ කියලා තමයි පේන්ට තියෙන්නේ.

එතකොට ඔය දෙකක් ගැන කියපු තැන තව තැනක් තියෙනවා ඔය විදිහට කතා කරපු බුදුහාමුදුරුවො. දැන් හුගාක් අය අල්ලගෙන ඉන්නවා, මම දැකලා තියෙනවා කතා කරනවා ආත්ම සංකල්පය ගැන. මම ගැන , මමත්වය ගැන. දැන් මේක ගැන විග්‍රහ කරොත් හරි පුදුම විදිහට මේ බුදුන්වහන්සේගේ ධර්මය අද විකෘති වෙලා තියෙන්නේ. ලෝකයේ පිරිසක් හිටියා ආත්මයක් තියෙනවා ,සදාකාලික ස්වර්ගයට නැත්තම් විමුක්තියට යන නැත්තම් දෙවියන් වහන්සේ ලගට යන, නැත්තම් සැප විදින ආත්මයක් ගැන, මම ඒක විස්තර කරන්ට යන්නේ නෑ. ආත්ම සංකල්පය තුල පොත් පත් කියවනකොට එක එක ආගම් වල ඕක තියෙනවා. මේ ආත්ම සංකල්පය තියෙන හැමතැනම මේක තියෙන්නේ ආගම් වල, ඒ ආත්මය ගලවගන්ට තමයි සියලු ආගම් හැදිලා තියෙන්නේ . හරි , එතකොට දැන් ඒ

එකක්. මොකද්ද මේ එක පැත්තක්, ආත්මයක් ඇත කියන පිරිස. ඊළඟට තව පිරිසක් හිටියා, නෑ නෑ එහෙම ආත්මයක් නෑ. භවයෙන් භවයට යන එහෙම ආත්මයක් නෑ, සැප විඳින කෙනෙක් නෑ. මරණින් පස්සේ මේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ ඒ ටික, ඒ ස්කන්ධ වලට එකතු වෙනවා, හුස්ම ටික එලියට ගියාට පස්සේ ආපහු ඉපදෙන කෙනෙක් නෑ. මැරෙන කෙනෙක් නෑ. මේ ඉන්න කෙනෙක් නෑ කියලා ඒ ආත්ම කතන්දරේ ප්‍රතික්ශේප කරා. අනිත් පිරිස කිව්වේ නෑ මෙහෙම ඉන්නවා, මරණින් පස්සේ අපි මැරුණා වුනත් ආත්මය අමරණීයයි. අපි දුක් වින්දට ආත්මය සැප විඳිනවා . ඒ වගේ හදාගත්තු දෙකක් තේ. එතකොට මේ ආත්මයක් ඇත යන්න එක සංකල්පයක්, ආත්මයක් නැත යන්න තවත් සංකල්පයක්. ආත්මයක් ඇත යන්න ආගම් බවට පත් වෙනවා, ආත්මයක් නැත යන්න නිරාගම් බවට පත් වෙනවා. ඒක තමයි නිරාගමික කියන්නේ.

ලෝකේ වැඩියෙන් ඉන්නේ නිරාගමිකයෝ. මොකද? ආත්ම, ආගම් විශ්වාස කරන්නේ නෑ, විශේෂයෙන් මාර්ක්ස් වාදියෝ, භෞතිකවාදය කරපින්නා ගත්ත මිනිස්සුන්ට විඤ්ඤාණය අමතක කරහම, එහෙම එකක් නෑ. අරක අල්ලගෙන ස්වර්ගයට  යන්න මෙහෙම එකක් තියෙනවා කියලා ඒක අල්ලගත්තහම ඒක ආගමක් වුනා. ඒ ආත්මයක් ඇත යන්න. සදාකාලික ආත්මයක් ඇත යන්න සාස්වත වාදය හැටියට බුදුන් වහන්සේ නම් කරා. ආත්මයක් නැත යන්න උච්චේද වාදය හැටියට නම්කරා. මේ දෙකත් අන්ත දෙකක්. දැන් පැහැදිළියි නේද? මේ කයිවාරු ගහන නිරාගමිකයො මේවා දන්නේ නෑ. එහෙමනම් පළවෙනියට බුදුන්වහන්සේ අවුරුදු දෙදහස් පන්සිය ගානකට පෙර මේක කියලා ඉවරයි. මේවා අලුත් අදහස් නෙවෙයි. මේවා මේ අද පහලවෙච්ච පඩිවරු, මේ මේ අද ඉන්න මේ බක පණ්ඩිතයො තෝර ගත්ත ඒවා නෙවෙයි. හොයාගත්ත ඒවා නෙවෙයි. මේවා එදා ඉඳලා මිනිස්සු මේවා කල්පනා කරලා කතා කරලා, කතා කරලා ශාස්තෘවරු මේවා කරලා තියෙනවා, කියලා තියෙනවා. පැහැදිළිද ඒ අන්ත දෙක එතකොට?... මොකද්ද මේ පැත්තෙත් සාස්වත වාදය, උච්චේද වාදය. සදාකාලික ආත්මයක් ඇත යන්න සාස්වත වාදය. සදාකාලික ආත්මයක් නැත හෝ කිසිම ආත්මයක් නැත යන්න උච්චේද වාදය. සාස්වත වාදියෝ ආගම් වදියෝ. උච්චේද වාදියෝ නිරාගමිකයෝ. හරිද? දැන් බුදුහාමුදුරුවෝ මොකේටද වැටෙන්නේ. බුදුහාමුදුරුවෝ ආත්මයක් ඇත කිව්වද? ආත්මයක් නැත කිව්වද? එහෙනම් මම ගැන කතා කරන්නේ. මමත්වයක් නෑ කිව්වා කියලා මිනිස්සු කියන්නේ ඇයි. මම කියලා කෙනෙක් නෑ කිව්වා කියලා කියන්නේ ඇයි එහෙනම් මිනිස්සු? එහෙම කියනවා නේ. කොහෙද බුදුහාමුදුරුවෝ එහෙම කියලා තියෙන්නේ. මම කියලා නෑ කිව්වද

බුදුහාමුදුරුවෝ. බුදුහාමුදුරුවෝ කිව්වා මෙන්න මේ අන්ත දෙක තියෙනවා. ආත්මයක් ඇත යන්න එක අන්තයක්, ආත්මයක් නැත යන්න තව අන්තයක්. මෙන්න මේ දෙකේ මිනිස්සු ඉන්නවා. ආත්මයක් ඇත කියලා සමහරු ඒක සත්තර්පණය කරන්න ආගමක් හදාගත්තා. ඒක නැහැයි කියපු මිනිස්සු භෞතික සැප සම්පත් විදිමින් මරණයෙන් මත්තේ සියල්ල අහෝසියි කියලා උච්චේද වාදය අල්ලගත්තා. බුදුහාමුදුරුවෝ කිව්වා "මහණෙනි මම මේ දෙකම කියන්නේ නෑ. මම මෙහෙම කියනවා. මොකද්ද මෙය ඇතිකල මෙය වේ. මෙය නැති කල මෙය නොවේ ". හරිද, A තියෙනවානම් B තියෙනවා, A නැත්නම් B නෑ. A නිසා B හටගන්නවා. A නැත්නම් B හටගන්නේ නෑ. මම මේ සරළ උදාහරණයක් කිව්වේ. මොකද්ද මේ කියන්නේ . අවිජ්ජා පච්චයා සංඛාරා. අවිජ්ජාව තියෙනකන් සංඛාර හටගන්නවා. අවිජ්ජාව තියෙනකන් තණ්හාව තියෙනවා. ඕකයි උත්තරේ. එතකොට හේතුපලයි නේද මේ කතන්දරේ. අවිජ්ජාවයි එතකොට මේ මෙතන තියෙන ප්‍රශ්නේ.

අවිජ්ජාව කියලා කිව්වේ මොකද්ද මේ?. මම මේ විදිහට, මේ විදිහට පවතිනවා කියලා පරම සත්‍ය නොදන්නා කම. දුක්ඛ ආර්‍ය සත්‍ය නොදන්නා කම. දුකට හේතුව තණ්හාව බව නොදන්නා කම. දුක නැති කිරීම තණ්හාව දුරු කිරීම කියන එක නොදන්නා කම. ඒ සදහා මාර්ගය ආර්‍ය අෂ්ටාන්ගික මාර්ගය  කියලා නොදන්න බව තමයි අවිජ්ජාව. දුක්ඛ ආර්‍ය සත්‍ය ගැන කියද්දී බුදුහාමුදුරුවො කියනවා ඉපදීම දුකයි ජරාව දුකයි, මරණය දුකයි. ඒ කතන්දරේ කියාගෙන ගිහිල්ලා අන්තිමට කියනවා සංකිත්තේන පංච උපාදානස්කන්ධා දුක්ඛා. මේ පංච උපාදානස්කන්ධයයි දුක. එතකොට පංච උපාදානස්කන්ධය දුක වෙන්නේ ඇයි. ඇතිවෙන නැතිවෙන නිස්දා. නැතුව දුක නිසාම  නෙවෙයි. මේක දුකනම් මිනිස්සු මෙච්චර මරාගෙන ඇනකොටාගෙන, පෙන්නේ නැත්ද දැන් වෙන හැල හැප්පිලි. බලය සදහා ඇන කොටාගන්න හැටි. ඈ. යුද්ධ කරන හැටි. උසාවි ගානේ යනහැටි. බිරිඳ ස්වාමියා අතරේ, දරුවෝ දෙමව්පියෝ අතරේ දේපල බෙදාගන්න බැරුව කොච්චර ජාති වෙනවද මේ. එතකොට මොකක් හින්දද මේ ඇණකොටාගෙන දඟලන්නේ. සැප හොයාගෙන යන්නේ. සැපක් තියෙන හින්දා. සැපක් නෑ කිව්වද බුදුහාමුදුරුවො. නෑ සැප තියෙනවා. ආශ්වාදයක් නැත්ද, ආශ්වාදය තියෙනවා. එහෙම නෑ කිව්වානම් බොරුවක්. දැන් මිනිස්සු ඇගේ අමාරුවටද දැන් මෙච්චර දඟලන්නේ, තියෙනවා. එතකොට දැන් මේ මොකද වෙලා තියෙන්නේ. හැබැයි එහෙම කියලා කියනවා ඒකේ අස්සෙන් දුකකුත් තියෙනවා. ඒ දන්නා දුක තියෙනවා. ලෙඩක් වුනහම වේදනා විඳින එක, කවුරුහරි මැරුනහම අඩන එක, තමන්ට අහිමි දේ, කැමති දේ

නොලැබුනහම, අකමැති දේ ලැබුණහම ඒක වෙනයි. නමුත් ඊට එහා ගිය දුකක් තියෙනවා . සංඛිත්තෙන පංච උපාදානස්කන්ධා දුක්ඛා කියලා බුදුහාමුදුරුවො පංච උපාදානස්කන්ධයක් ගැන කිව්වා. ඒක දුක වෙන්නේ සැප නැති නිසාම නෙවෙයි. ඇතිවෙන නැතිවෙන දේවල් සැපයි කියලා ගන්ට බෑ, ඒක තර්කයක්. හේතුවක් නිසා යමක් හටගන්න වා නම් හේතු නැතිවීමෙන් නිරුද්ධ වෙනවානම්, ඇතිවෙමින් නැතිවෙමින් යන ක්‍රියාවලියක් අපිට අල්ලන්ට බෑ. ඇතිවෙවී නැතිවෙවී යන පෙන ගොඩක් අපිට අල්ලලා නවත්වගන්ට පුලුවන්ද? බෑ. ඒක නැතිවෙනවා. දිය බුබුලක් මතු වෙනවා වතුර බින්දුවක් වතුරට වැටුනහම. ඒක එවෙලේම නැතිවෙ ලා යනවා. මිරිගුවක් වගේ පේනවා, මිරිගුව කියන්නේ ජලය නෙවෙයි. අරටුව හොයන මිනිහෙක් කෙහෙල් කඳක් අරගෙන කොච්චර පතුරු ගැලෙව්වත් අරටුවක් ලැබෙන්නේ නෑ. ඒ වගේ බුදුහාමුදුරුවො මේ හේතුටික කිව්වා. මේ පංචස්කන්ධය සහ පංච උපාදානස්කන්ධයේ ලක්ෂණ ටික. එතකොට මේ පංච උපාදා නස්කන්ධය හේතුවකින් හටගන්නවා, හේතු නැතිවුනහම නිරුද්ධ වෙනවා. ඒකටයි දුක කියලා කිව්වේ. ඇතිවෙන නැතිවෙන හින්දා මිස වෙන හේතුවක් නිසා නෙවෙයි. එතකොට මොකද්ද වෙන්නේ, මේ පංච උපාදානස්කන්ධය ඇතිවෙන්නේ එතකොට හේතුවකින්. ඒක අල්ලගෙන ඉන්නේ තණ්හාව නිසා. තණ්හාව නැති කරොත් එයින් මිදෙන්ට පුලුවන්. එයින් මිදෙන මාර්ගය අයි' අෂ්ටාන්ගික මාර්ගය. මිදීම තමයි නිවන කියලා දැක්වුවේ. ඉතින් අපිට මේ බුදුහාමුදුරුවො කියපු ආතම සංකල්පය, ආත්මයක් ඇතවත් නැතවත් නෙවෙයි, හේතුවකින් හටගන්නවා, හේතු තියෙනකම් මේ ක්‍රියාවලිය සිදුවෙනවා. අවිජ්ජාව පච්චයා සංඛාරා කියලා මේක දේශනා කරා. බුදුහාමුදුරුවො කිව්වා මහණෙනි මම ආත්මයක් ඇත කියන්නෙත් නෑ, ආත්මයක් නැත කියන්නේත් නෑ , ඒ දෙකට මැදින් මම පංච උපාදා නස්කන්ධ ක්‍රියාවලිය ප්‍රකාශ කරනවා කියලා සූත්‍ර වල තියෙනවා. ඔව්ද? නැද්ද? අන්ත නව තැනක් බුදුහාමුදුරුවො මැදින් බන කියපු. දැක්කද ද්විත්වය. අවස්තා දෙකයි තියෙන්නේ මට හම්බුවෙලා තියෙන්නේ, මගේ තේරෙන විදිහට. එකක් ධම්මචක්ක සූත්‍රයේ කියනවා අතථකිලමතානු යෝගය සහ කාමසුඛල්ලිකානි යෝගය අත්හළ යුතු අන්ත දෙකක්. ඒ දෙක වෙනුවට බුදුහාමු දුරුවො යෝජනා කරනවා ආර්‍ය අෂ්ටාන්ගික මාර්ගය. ඒක එතෙරවීම සඳහා පමණයි. නිවන් දැකීම සඳහා පමණයි. නිවන් දැක්කට පස්සේ ඒකත් අතහරිනවා කිව්වා. හැබැයි ඊළගට ද්විත්වයක් ගැන දෙකක් ගැන කතා කරන්නේ මෙතෙන්දි. ආත්මයක් ඇත යන්න සාස්වත වාදයත්, ආත්මයක් නැත යන්න උච්චේද වාදයත් ලෙස නම් කරලා. ආත්මයක් ඇත යන්න ආගම් වලට වැටෙනවා , ආත්මයක් නැත

යන්න නිරාගමික කියාගන්න ඒ මිනිස්සු න්ට වැටෙනවා, ඒ දෙකම බුදුහාමුදුරුවො වැටෙන්නේ නෑ.

බුදුන්වහන්සේ මේ දෙකම නැති වෙනත් හේතුඵල ධර්මතාවයක් දේශනා කරා. පැහැදිළිද මේ කියපු ටික. මෙක මම දන්නේ නෑ කොතෙක් මිනිස්සුන්ට තේරෙනවද නැත්ද කියන්න. මෙක අවශ්‍යද නැත්ද කියන්න දන්නේ නෑ. නමුත් එළියේ තියෙන මේ ගැටළු සහගත ආගමික ගැටුම් අතරේ වාද විවාද අතරේ, වාද ඇතිවෙ න්නත් හේතුවෙලා තියෙන කරුනු ටිකක් නිසා මම මෙක කිව්වේ ඔයගොල්ලන්ට. තේරුණාද මේ ටික. මම දන්නේ නෑ ප්‍රයෝජනයක් ඇත්ද නැත්ද, චුට්ටක් හිතලා බලන්ට. මේ බුදුන්වහන්සේගේ දහම හරිම පුදුම සූක්ෂම, ගැඹුරු, ඉතාම ප්‍රණීත, හරිම සුන්දර දහමක්. හැබැයි මෙක ආවාට ගියාට වචන අල්ලන් අර ජාති අන්ධයෝ වගේ මෙක කරන්ට බෑ. පොකුණේ හිටපු මාළුවෝ වගේ මෙක අධ්‍යයනය කරන්ට බෑ. හරියට ගන්ට ඕනේ හරියට කරන්ටනම්. හැබැයි මෙකේ ප්‍රතිපල තියෙනවා, ගුරු ඇසුරට ගිහිල්ලා කියපු විදිහට ආරණ්‍ය ගතෝවා, වෘක්ෂමූල ගතෝවා, ශූන්‍යාගාරගතෝවා, ඒ ක්‍රමයට ගිහිල්ලා මෙක, ප්‍රතිපධාව පුරලා තමන්ගේ අත්දැකීමෙන්ම ගන්ට ඕනේ එකක්. දැන් මට තියෙන චොදනාවක්නේ. මේ ස්වාමීන්වහන්සේ හැමවෙලේම කැලේට යන්න කියනවා, අපිට කැලේට යන්න බෑ, දාලා යන්න බෑ. මොනවද මේ කියන්නේ දැන් කාමසුඛල්ලිකානු යෝගය අත්හළයුතු අන්තයක්. ගෙදර ඉදන් කරන්නේ කම් සැප විදින එක. ඉතින් කම් සැප විදලා බෑ නිවන් දකින්ට. ඒකයි යන්ට කිව්වේ. කැලේට යන්ට කිව්වහම තව පිරිසක් කියනවා, කැලේට යනවා කියන එක අත්‍ථකිලමතානු යෝගය, ඒක හරියන්නේ නෑ. මේ කොළඹ නගරයේ ඉන්න, පන්සලේ ඉන්න ගමේ හාමුදුරුවො මෙක කියන්නේ. මේ ගිහියෝ මෙක කියන්නේ. බුදුහාමුදුරුවො නෙවෙයි. බුදුහාමුදුරුවො ඒකත් අතහරින්ට කිව්වා, මෙකත් අතහරින්ට කිව්වා. කෙලින්ම කාමයන්ගෙන් අයින් වෙන්ට ඕනේ. අයින් වෙලා සමාජයෙන් ඉවත් වෙලා මෙක වඩන්ට ඕනේ. හැබැයි සමාජයෙන් ඉවත් වෙන්න මිනිස්සු නැති තැනකට යන්ට ඕනේ. එක්කෝ කැලේ , එක්කෝ ගහක් මුල, එහෙම නැත්නම් ශූන්‍යාගා රයේ, හැබැයි ඒක අත්ථකිලමතානු යෝගය නෙවෙයි. අත්ථකිලමතානු යෝගය කියන්නේ වෙනම දුක් දීමක්. ඒකත් තේරුම් ගන්ට. ඒ දෙක අතහැරළා මාර්ගය වඩන්ට. මාර්ගය ආර්‍ය අෂ්ටාන්ගික මාර්ගය, ඒක පටන්ගන්න කොටම, භාවනාව පටන්ගන්න කොට, සියල්ල පටන්ගන්නකොට පටන්ගන්නේ ආරණ්‍යගතෝවා වෘක්ෂමූල ගතෝවා කියලා. ඒක නිසා කරුණාකරලා මතක තියාගන්න මේ බන වජ්‍රබුද්ධිගෙනම් නෙවෙයි. හරි. වජ්‍රබුද්ධි බන නෙවෙයි මම මේ කියන්නේ. මගේ කට තිබුනට, මට මේ නම තිබුනට බුදුන්වහන්සේ වදාළ එකමයි කියන්නේ.

හොඳට හිතලා බලන්ට. එතකොට දැන් හරි නේ අන්ත දෙක. ද්විත්වය. ඒ එක තැනක්, දෙවෙනි එක මම කිව්වා ආත්මයක් ඇතද යන්න නැතද යන්න. නිරාගමිකයෝ කියන අයත් පොඩ්ඩක් පරිස්සම් වෙන්ට. නිරාගමිකයො කියන්නේ මහ ලොකු කෙරුමෝ ජාතියක් නෙවෙයි, මේවා අලුත් සංකල්ප නෙවෙයි, මේවා කාලයක් කතා කරලා මිනිස්සු ඕවට උත්තර හොයාගෙන ඉවරයි බොහොම සතවර්ග බොහෝ කාලයකට පෙර. මේ දැන් ඉන්න ටික දෙනෙක් මේ Facebook එක හරහා වෙන වෙන ඒවා හරහා, මාධ්‍ය හරහා නිකන් කාඩ්බෝර්ඩ් වීරයෝ වෙන්ට යනවා. බුදුන්වහන්සේ වැනි ශාස්තෘවරු ඉදිරියේ මේගොල්ලෝ කවුද? ඒ අයටත් අභියෝග කරන්වා. ඔය සමහරු දැන් තියෙන්නේ එක එක නම් දාල පොත් ලියලා ආගම් කතුවරුන්ට බැනගෙන තමන්ගේ නැහැදිච්ච කම පෙන්නන්නේ. වෙන මුකුත් නම් නෙවෙයි. තමන් නොදන්න දේ නොදන්න බව දැනගෙන ඉගෙන ගන්ට වීර්‍ය කරන්ට. හොඳට දැනගෙන කතා කරන්ට. අනුන්ගේ දෙයක් අනුන්ගෙන් අරගන්නානම් ඒ නම ගම කියලා කතාකරන්ට. ඒ දේම කියන්ට. නොතේරෙනවනම් ඒ දේ නොතේරෙනවා කියන්ට. බුද්ධිමත් වෙන්ට. අනුන්ගේ දේ කොල්ල කන්ට එපා. බුදුන්වහන්සේ ගේ ධර්මය තමන්ගේ කරගන්ටත් එපා. තමන් ඒකට යමක් ඈතුළු කරන්ට යන්ටත් එපා. වෙනස් කරන්ට යන්ටත් එපා. බුද්ධ වචනය කෙළෙසන්ටත් එපා. බුදුන්වහන්සේගේ ධර්මය කෙළෙසන්ටත් එපා. උන්වහන්සේගේ ධර්මය පිළිපැදගෙන මෙතෙක් පැවත එන ආර්‍යයන්වහන්සේල කෙළෙසන්ටත් එපා. සිවුරි දාගත් පමණින් කිසිවෙක් ආර්‍යයෙක් වෙන්නෙත් නෑ. බුද්ධශ්‍රාවකයෙක් වෙන්නෙත් නෑ. ධර්මය අඳුනගන්නා වෙන්නෙත් නෑ. බුදු දහම දන්නවා කියන්ටත් බෑ. බෞද්ධයෙක් වෙන්නෙත් නෑ. ඒකත් හොඳට මතක තියාගෙන මේක බොහොම පරිස්සමෙන් ගන්ට.

මේ දහම පරිස්ස මෙන් ගන්ට ඕනේ කියලා බුදුහාමුදුරුවො කියලා තියෙනවා. ධර්මය උපමා කරලා තියෙන්නේ සර්පයෙකුට. මහා භයාමක විෂඝෝර සර්පයෙකුට. මේ සර්පයා, සර්පයෝ අල්ලන මිනිස්සු ඔයගොල්ලෝ අහලා ඇති, දැකලා ඇති. ඒ සර්පයො අල්ලන ශාස්ත්‍රය ඉගෙන ගෙන බොහොම ඉවසිලිවන්තව, හරියට ගිහිල්ලා ඒ සර්පයාගේ බෙල්ලෙන් අල්ලගන්ට ඕන, නැත්නම් ඌ දශ්ඨ කරනවා. දශ්ඨ කරොත්, ලොකු වේදනාවකට පත්වෙනවා. පත්වෙලා මිය යන්ටත් පුළුවන්. හැබැයි මේ ධර්මය වැරදියට අල්ල ගත්තොත්, සර්පයා ඇල්ලුවා වගේ නෙවෙයි. සර්පයාගේ බඩින් අල්ලගෙන, වලිගෙන් අල්ලගෙන දශ්ඨ කලොත්නම් දුකකට පත්වීම හෝ මරණයෙන් කෙළවර වෙනවා ඒක. ධර්ම වරද්දවලා

ගත්තොත් තම් මරණෙත් කෙළවර වෙන්නෙත් නෑ බොහෝ කාලයක් අනාගතයේත් දුක් පිණිස හේතු වෙනවා…දුගතිගාමී වෙලා. මේක පොතේ තිබ්බට නොදැන තමයි ඔය ධර්මයේ උණුසුමක්වත් නොදැකපු මිනිස්සු ඔය එළියේ මේ පා පන්දු කෙළියේ තියැලෙමින් බුදු දහම පන්දුවක් කරගෙන පයින් ගසමින් සිටින්නේ…. පරිස්සම් වෙන්ට!”

**නිමි.**

**2018 ඔක්තෝම්බර 28**

# <u>ගවේශනය කිරීමට</u>

*** අතිපූජනීය මහනුවර වජිරබුද්ධි මහ රහතන්වහන්සේගේ සියළුම පටිගත කරන ලද දේශනා ශ්‍රවනය කිරීමට පහත YOUTUBE සහ FACEBOOK links වලට පිවිසෙන්න.**

**CHANNEL LINK:**




https://www.youtube.com/channel/UCwTkvCz1d-3F1bXbqzfedVQ

**LINKS:**

**“THE PATH TO NIBBANA”**

https://www.facebook.com/ThePathToNibbana/

**“සම්මා දිට්ඨි - SAMMĀ DITTHI”**
**ප්‍රබුද්ධ ජන සමාජයක් උදෙසා, බෞද්ධ දර්ශනය.**

https://www.facebook.com/WajirabuddhiTheroSammaDitthi/

*** අතිපූජනීය මහනුවර වජිරබුද්ධි මහ රහතන්වහන්සේගේ පටිගත කරන ලද දේශනා සහ දේශිත සද්ධර්ම ලිපි ඇතුළත් එම වෙබ් අඩවිය(WEBSITE).**

**LINK:**

**“නිවන් මග - අතිපූජනීය මහනුවර වජිරබුද්ධි මහ රහතන්වහන්සේගේ දේශනා ආශ්‍රිතව සැකසුනු වෙබ් අඩවියකි”**

https://www.mahanuwara-wajirabuddhi-thero.org/si

“The Path to Nibbāna” සහ "සම්මා දිට්ඨි - Sammā Ditthi" යන නමින් ඇති එම Facebook පිටුද, YouTube හි "අතිපූජනීය මහනුවර වජිරබුද්ධි මහ රහතන්වහන්සේ” යන නමින් ඇති එම වැනලයද එමෙන්ම, 'නිවන් මග’ (https://www.mahanuwara-wajirabuddhi-thero.org/si) නමින් ඇති අතිපූජනීය මහනුවර වජිරබුද්ධි මහ රහතන්වහන්සේගේ දේශනා ආශ්‍රිතව සැකසුනු එම වෙබ් අඩවිය ඇතුළු ඒ සියල්ල පවත්වාගෙන යනු ලබන්නේ ගෞතම බුදුරජාණන් වහන්සේ විසින් දේශිත නිර්මල බුදු දහම සොයන ගිහි පිරිසක් විසිනි. අපගේ අරමුණ සංස්කෘතික හා සාම්ප්‍රදායික හේතූන් මත වැලලී ගිය නිර්මල බුදු දහම ඉස්මතු කර එය ධම්ම දානය ලෙස ලෝකයාහට බෙදාහැරීමේ උත්සාහයක් බව කරුණාවෙන් සලකන්න.